කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

තනතුරු පුරප්පාඩු - පුල්මුඩේ යන්ත්‍රාගාරය

පූර්ණ රජය සතු සමාගමක් වන ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනයෙහි පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යන්ත්‍රාගාර / මෙහෙයුම්)
Deputy General Manager (Plant / operations)

ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය (HM 1-3)

පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යාපන සුදුසුකම් -

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, ලබාගත් ඉංජිනේරු උපාධියක් ලබාතිබීම

සමග

කැනීම් හා සැකසීම් / යාන්ත්‍රික / සිවිල් / විදුලි පිළිබඳ පශ්චාත් උපාධියක් ලබාතිබීම.

හෝ

ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාලව පිළිගත් වරලත් ඉංජිනේරු ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

පළපුරුද්ද - රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 17 පළපුරුද්දක් සමග ඉතා හොඳ යහපත් සේවා වාර්තාවක් තිබීම.

(ආ) අධ්‍යාපන සුදුසුකම් -

ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වරලත් ඉංජිනේරු ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

පළපුරුද්ද - රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 17 පළපුරුද්දක් සමග හොඳ යහපත් සේවා වාර්තාවක් තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබාතිබීම.

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(2) ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1) සේවා ගණයෙහි අවම වශයෙන් අදාළ විෂය ක්ෂේත්‍රයෙහි වසර 2 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(3) කළමනාකාර (MM 1-1) සේවා ගණයේ තනතුරක 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 7 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

HM -1-3, සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - HM -1-3, රු.152,500/-, 4,100 X 15 =214,000/=

වැටුප් පරිමාණයේ රු.152,500/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන II ප්‍රකාරව 2026.01.01 දින සිට රු.133,028/- වැටුපක් ගෙවනු ලැබේ.

වයස් සීමාව : අවු: 35 ට නොඅඩු විය යුතු අතර, අවු: 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

02. ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු හා සේවා)
Chief Engineer (Maintenance Service)

ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය (HM 1-1)

පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

(අ) අධ්‍යාපන සුදුසුකම් /වෘත්තිය සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, යාන්ත්‍රික / විදුලි / සිවිල් පිළිබඳ ඉංජිනේරු උපාධියක් ලබා තිබීම

සමග

යාන්ත්‍රික / විදුලි / සිවිල් පිළිබඳ පශ්චාත් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

හෝ

යාන්ත්‍රික / විදුලි /සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වරලත් ඉංජිනේරු ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

පළපුරුද්ද - රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 පළපුරුද්දක් සමග ඉතා හොඳ යහපත් සේවා වාර්තාවක් තිබීම.

(ආ) අධ්‍යාපන සුදුසුකම් වෘත්තිය සුදුසුකම්

යාන්ත්‍රික / විදුලි / සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වරලත් ඉංජිනේරු ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

පළපුරුද්ද - රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 පළපුරුද්දක් සමග ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(2) කළමනාකාර (MM 1-1) සේවා ගණයෙහි 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

HM -1-1, සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - HM -1-1, රු.140,640/-, 4,100 X 15 =202,140/=

වැටුප් පරිමාණයේ රු.140,640/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන II ප්‍රකාරව 2026.01.01 දින සිට රු.123,019/- වැටුපක් ගෙවනු ලැබේ.

වයස් සීමාව : අවු: 35 ට නොඅඩු විය යුතු අතර, අවු: 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

03. කැණීම් සැකසුම් ඉංජිනේරු
(Mining & Processing Engineer)

කළමනාකාර සේවා ගණය (MM 1-1)

පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

(අ) අධ්‍යාපන සුදුසුකම් / වෘත්තිය සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, ලබාගත් ඉංජිනේරු (කැණීම් සැකසීම්) උපාධියක්

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

(ආ) කැනීම් සැකසීම් පිළිබඳව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල / හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(2) කනිෂ්ඨ කළමනාකාර (JM 1-2) සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර පහ (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

MM -1-1, සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - MM -1-1, රු.91,690/-, 2480X10, 3450X15=168,240/-

වැටුප් පරිමාණයේ රු.91,690/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන 11 ප්‍රකාරව 2026.01.01 දින සිට රු.81,710/- වැටුපක් ගෙවනු ලැබේ.

වයස් සීමාව : අවු: 22 ට නොඅඩු විය යුතු අතර, අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

04. නිෂ්පාදන ඉංජිනේරු
Production Engineer

කළමනාකාර සේවා ගණය (MM 1-1)

පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

(අ) අධ්‍යාපන සුදුසුකම් / වෘත්තිය සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, ලබාගත් ඉංජිනේරු (නිෂ්පාදන) උපාධියක්

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පිළිගත් ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

(ආ) නිෂ්පාදනය පිළිබඳව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල / හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(2) කනිෂ්ඨ කළමනාකාර (JM 1-2) සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර පහ (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

MM -1-1, සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - MM -1-1, රු.91,690/-, 2480X10, 3450X15=168,240/-

වැටුප් පරිමාණයේ රු.91,690/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන 11 ප්‍රකාරව 2026.01.01 දින සිට රු.81,710/- වැටුපක් ගෙවනු ලැබේ.

වයස් සීමාව : අවු: 22 ට නොඅඩු විය යුතු අතර, අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

05. යාන්ත්‍රික ඉංජිනේරු
Mechanical Engineer

කළමනාකාර සේවා ගණය (MM 1-1)

පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

(අ) අධ්‍යාපන සුදුසුකම් / වෘත්තිය සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, ලබාගත් ඉංජිනේරු (යාන්ත්‍රික) උපාධියක්

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පිළිගත් ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

(ආ) යාන්ත්‍රික කටයුතු පිළිබඳව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල / හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(2) කනිෂ්ඨ කළමනාකාර (JM 1-2) සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර පහ (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

MM -1-1, සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

වැටුප් කේත අංකය - MM -1-1, රු.91,690/-, 2480X10, 3450X15=168,240/-

වැටුප් පරිමාණයේ රු.91,690/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන 11 ප්‍රකාරව 2026.01.01 දින සිට රු.81,710/- වැටුපක් ගෙවනු ලැබේ.

වයස් සීමාව : අවු: 22 ට නොඅඩු විය යුතු අතර, අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

06. විදුලි ඉංජිනේරු
Electrical Engineer

කළමනාකාර සේවා ගණය (MM 1-1)

පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

(අ) අධ්‍යාපන සුදුසුකම් / වෘත්තිය සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, ලබාගත් ඉංජිනේරු (විදුලි) උපාධියක්

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

(ආ) විදුලි කටයුතු පිළිබඳව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල / හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(2) කනිෂ්ඨ කළමනාකාර (JM 1-2) සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර පහ (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

MM -1-1, සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - MM -1-1, රු. 91,690/-, 2480X10, 3450X15=168,240/-

වැටුප් පරිමාණයේ රු.91,690/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන 11 ප්‍රකාරව 2026.01.01 දින සිට රු.81,710/- වැටුපක් ගෙවනු ලැබේ.

වයස් සීමාව : අවු: 22 ට නොඅඩු විය යුතු අතර, අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

07. භූ විද්‍යාඥ
Geologist

කළමනාකාර සේවා ගණය (MM 1-1)

පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම්

අධ්‍යාපන සුදුසුකම්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් භූ විද්‍යා උපාධියක්, (රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යා විෂය ඇතුළත්) හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබාතිබීම.

සමග

උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක භූ විද්‍යා ක්ෂේත්‍රයට අදාළ වසරක පළපුරුද්ද

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

ඉහත සඳහන් බාහිර සුදුසුකම් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

MM -1-1, සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව

වැටුප් කේත අංකය - MM -1-1, රු. .91,690/-, 2480X10, 3450X15=168,240/-

වැටුප් පරිමාණයේ රු.91,690/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා උපලේඛන 11 ප්‍රකාරව 2026.01.01 දින සිට රු.81,710/- වැටුපක් ගෙවනු ලැබේ.

වයස් සීමාව : අවු: 22 ට නොඅඩු විය යුතු අතර, අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

දීමනා හා ප්‍රතිලාභ

දීමනා

01. භාණ්ඩාගාරය අනුමත කළ රු.17,800/- වන ජීවන වියදම් දීමනාව
02. මාසික ආහාර දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මාසික පැමිණීමේ දිරිදීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
04. මසකට රු.4,000/- වන දුෂ්කර දීමනාව (පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවකයන් සඳහා පමණි)
05. මාසික නිෂ්පාදනය මත ගෙවනු ලබන නිෂ්පාදන දිරි දීමනාව (මාසික ඉල්මනයිට් නිෂ්පාදනය මත පදනම් වේ)
06. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව සන්නිවේදන දීමනාව
07. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව වෘත්තිය දීමනාව ගෙවීම් කරනු ලැබේ.

ප්‍රතිලාභ

01. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)
02. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය
    i. වසරක් සඳහා රු.300,000/- ක රෝහල් ගතවීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    ii. වසරක් සඳහා රු.25,000/- ක බාහිර ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    iii. වසරක් සඳහා රු.10,000/- ක දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
03. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබාදීම.
    i. අභ්‍යන්තර වෛද්‍යාධාර ක්‍රමය යටතේ වසර දෙකකට වරක් රු.12,000/- ක දීමනාව.
    ii. අභ්‍යන්තර වෛද්‍යාධාර ක්‍රමය යටතේ වසරකට වරක් බාහිර ප්‍රතිකාර වෙනුවෙන් රු.5000/- මුදලක් ලබාදීම
    iii. දරු උපතක් වෙනුවෙන් වසර 02 කට වරක් රු.12,000/- මුදලක් ලබාදීම.
04. මීට අමතරව ස්ථිර සේවකයන් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.
05. සේවකයා විසින් සේවක අර්ථ සාධක අරමුදල් දායකත්වය 10% ක්ද ,සමාගම විසින් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා ආයතනයේ දායකත්වය 3% වේ.
    1. සෑම ඉල්ලුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
    2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.
    3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
    4. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ මුලූ ඉපයීම්වලින් උපයන විට ගෙවීම් බද්ද (Pay as You Earn Pay Tax) අය කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර අදාළ දෙපාර්තමේන්තුවල/ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද තනතුරු සඳහා අයදුම්පත් යොමු කිරීමේදී ඊමේල් ලිපිනයද ඇතුළත් කර ඔබගේ අත්සන සහිතව අයදුම්පත එවිය යුතු අතර, ඔබගේ අයදුම්පතෙහි දක්වා ඇති පරිදි සියලුම අධ්‍යාපන, වෘත්තිය හා සේවා සහතික පත්‍රවල ඡායාස්ථ පිටපත් ඒ සමග එවිය යුතුවේ. (නිසි පරිදි සහතික පත්‍රවල ඡායාපිටපත් යොමු කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

ඔබ විසින් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර රාජගිරිය, සරණ මාවතේ, අංක 341/13 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති වෙත 2026.01.14 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් යොමු කළ යුතු වේ.

07. ආරක්ෂක කළමනාකාර (වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම)
Sucurity Manager

කළමණාකාර සේවා ගණය (MM-1-1)

පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන්

අධ්‍යපන හා වෘත්තිය සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක්

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය පොලිස් සේවයේ / හමුදා සේවයේ /පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) ක පළපුරුද්ද

කොන්ත්‍රාත් දීමනාව ලෙස මාසිකව රු.175,000/- ක් ගෙවනු ලැබේ.

ප්‍රතිලාභ

01. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)
02. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය
    i. වසරක් සඳහා රු.300,000/- ක රෝහල් ගතවීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    ii. වසරක් සඳහා රු. 25,000/- ක බාහිර ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    iii. වසරක් සඳහා රු.10,000/- ක දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
03. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබාදීම.
    i. අභ්‍යන්තර වෛද්‍යාධාර ක්‍රමය යටතේ වසර දෙකකට වරක් රු.12,000/- ක දීමනාව.
    ii. අභ්‍යන්තර වෛද්‍යාධාර ක්‍රමය යටතේ වසරකට වරක් බාහිර ප්‍රතිකාර වෙනුවෙන් රු.5000/- මුදලක් ලබාදීම
    iii. දරු උපතක් වෙනුවෙන් වසර 02 කට වරක් රු.12,000/- මුදලක් ලබාදීම.
04. මීට අමතරව ස්ථිර සේවකයන් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.
05. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 10% ක්ද, සමාගම විසින් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා ආයතනයේ දායකත්වය 3% වේ.
06. සෑම ඉල්ලුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
07. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.
08. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.
09. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ මුලූ ඉපයීම් වලින් උපයන විට ගෙවීම් බද්ද (Pay as You Earn Pay Tax) අය කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර අදාළ දෙපාර්තමේන්තුවල/ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද තනතුරු සඳහා අයදුම්පත් යොමු කිරීමේදී ඊමේල් ලිපිනයද ඇතුළත් කර ඔබගේ අත්සන සහිතව අයදුම්පත එවිය යුතු අතර, ඔබගේ අයදුම්පතෙහි දක්වා ඇති පරිදි සියලුම අධ්‍යාපන, වෘත්තිය හා සේවා සහතික පත්‍රවල ඡායාස්ථ පිටපත් ඒ සමග එවිය යුතුවේ. (නිසි පරිදි සහතික පත්‍රවල ඡායාපිටපත් යොමු කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

ඔබ විසින් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර රාජගිරිය, සරණ මාවතේ, අංක 341/13 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති වෙත 2026.01.14 දිනට පෙර ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් අයදුම්පත් යොමු කළයුතු වේ.

සභාපති
ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්
අංක 341/13, සරණ මාවත,
රාජගිරිය.